සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර ඇගයීම
மூன்றாந் தவணை **2019**
**Third Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි.

( i ) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

( ii )අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii)ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.

---

(01) ප්‍රධාන ජන මාධ්‍ය අතරින් ප්‍රවෘත්ති වාර්තාකරණයේදී සරල සුගම භාෂා ශෛලියක් අවශ්‍ය වන්නේ,

(1) ගුවන් විදුලිය (2) පුවත්පත (3) රූපවාහිනිය (4) සඟරාව

(02) තම විෂය හා සම්බන්ධ පොතක් මිලදීගත් නිමල්ට එහි පෙළෙහි බොහෝ මුද්‍රණ දෝෂ ඇති බව දැකගත හැකි විය.මීට වගකිව යුත්තේ,

(1) මුද්‍රණ ශිල්පියා (2) පරිගණක අක්ෂර සංයෝජනය

(3) සෝදුපත් පරීක්ෂක (4) පොත් ප්‍රකාශක

(03) මාධ්‍ය අභිසාරිතාව ඇතිවීමට ප්‍රධාන හේතුව නම්,

(1) ජන මාධ්‍ය ප්‍රබල ලෙස ව්‍යාප්තව පැවතීම (2) නව මාධ්‍ය ආගමනය

(3) සමාජ මාධ්‍ය තහනම් කිරීම (4) ග්‍රාහක සංඛ්‍යාවේ ප්‍රසාරණ

(04) ශාන් වික්‍රමසිංහ,අනිල් විජේවර්ධන හා බොබී ක්‍රිස් යන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් මෙරට ආරම්භ කළ ප්‍රථම රූපවාහිනී නාලිකාව,

(1) ටී.එන්.එල්.රූපවාහිනීය (2) ජාතික රූපවාහිනීය

(3) ස්වාධීන රූපවාහිනීය (4) ස්වර්ණවාහිනී

(05) පුවත්පතක රිද්මය පෙන්වන සමකාලින සිදුවීමක් පිළිබඳ ව ලියවෙන සටහන,

(1) ප්‍රධාන ශිර්ෂ පාඨය (2) සංස්කාරක වැකිය

(3) තීරු ලිපිය (4) ප්‍රධාන කාටූනය

(06) ශ්‍රව්‍ය , දෘශ්‍ය හා ලිඛිත මාධ්‍යයන්හි සංස්කරණ ක්‍රියාවලියෙන් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,

(1) සංක්ෂිප්ත බව ඇති විම. (2) වියදම් අවම කර ගැනීම.

(3) කලා අධ්‍යක්ෂකගේ අඛණ්ඩතාවය රැක ගැනීම. (4) අර්ථය මතුකර ගැනීම.

(07) අන් මාධ්‍යයන්ට සාපේක්ෂව තොරතුරු දොරටු පාලන ක්‍රියාවලියට ලක්වීමට අවම ඉඩක් ඇත්තේ,

(1) අන්තර්ජාලය (2) පුවත්පත

(3) ගුවන්විදුලිය (4) රූපවාහිනීය

(08) විවිධ ආයතනයන් ආවෘත පරිපථ (CCTV) රූපවාහිනි සවි කිරීමේ මූලික අරමුණ,

(1) ප්‍රවෘත්ති මූලාශ්‍ර සපයා ගැනීම. (2) පසුගිය වැඩ සටහන් නැරඹීම.

(3) බාහිර හා අභ්‍යන්තර කටයුතු සුපරීක්ෂණය (4) තොරතුරු ජාලගත ව්‍යාප්තියට

(09) අත් පිටපත සම්පාදනය → සංස්කරණය → යතුරු ලියනය → සෝදුපත් පරීක්ෂාව → මුද්‍රණය

මෙම ක්‍රියාවලියට ඍජුව අදාළ වන්නේ,

(1) පුවත්පත (2) ගුවන්විදුලිය (3) රූපවාහිනී (4) සිනමාව

(10) ඉහත වෘත්තීන්ට සම්බන්ධ නොමැති නමුත් වැදගත් මාධ්‍ය ශ්‍රමිකයෙක් වන්නේ,

(1) මාණ්ඩලික වාර්තාකරු (2) සංස්කාරක

(3) සෝදුපත් පරීක්ෂක (4) ඡායාරූප ශිල්පියා

(11) සන්නිවේදනයට බලපාන්නා වූ බාධක තත්වයන් පිළිබඳ ගණිතමය ආකෘතියෙන් මුල් වරට පෙන්වා දුන්නේ,

(1) හැරල්ඩ් ඩී ලැස්වෙල් (2) ෂැනොන් විවර්

(3) මිල්ටන් බ්‍රෂ් (4) පෝල් ඩී මැසනියර්

(12) තොරතුරක් ඉදිරිපත් කිරීමේ දී අවම වශයෙන් මූලාශ්‍ර දෙකකින්වත් සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගැනීමෙන් මනා පිළිගැනීමක් ඇති වේ.මීට අදාළ ගුණාංගය වන්නේ,

(1) නිවැරදි බව. (2) සමතුලිත බව (3) පැහැදිලි බව (4) නිර්මාණාත්මක බව

(13) නවකතා,විශේෂාංග ලිපි ආදී වාර්තාකරණයේ දී භාවිතා වන්නේ,

(1) උඩුකුරු පිරමිඩ ආකෘතිය (2) යටිකුරු පිරමිඩ ආකෘතිය

(3) A + B +C= C සරල සමීකරණය (4) ඍජු වාර්තාකරණය

(14) ලොව ප්‍රථම ප්‍රකාශන හිමිකම් නීතිය ලෙස සැලකෙන්නේ,

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(2) රැජිණගේ ව්‍යවස්ථාව (Queen Ann's Statute)

(3) මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය

(4) බුද්ධිමය දේපල පනත

(15) ක්‍රිස්තියානි ආගම ඇගයීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකාවේ පළවූ පළමු සඟරාව නම්,

(1) ලන්දේසි යාඥා පොත (2) වජ්‍ර සූත්‍රය

(3) කලම්බු ජර්නල් (4) මාසික තෑග්ග

(16) යමෙකුට ප්‍රකාශන හිමිකම ලැබෙනුයේ ජීවිත කාලය තුළත් ඉන්පසු තවත් වසර,

(1) 10 ක් පමණි. (2) 25 ක් පමණි.

(3) 75 ක් පමණි. (4) 100 ක් පමණි.

(17) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ඵලදායි සන්නිවේදනයට ශ්‍රව්‍ය ස්වරූපය ද හේතු වේ.

(2) ලිඛිත සන්නිවේදනය වාචික මෙන්ම නිර්වාචික විය හැකිය.

(3) පාර භාෂාවේදී හඬ වැදගත් නොවේ.

(4) සන්නිවේදනයේදී ඇස් සබඳතාවය වැදගත් වේ.

(18) මුවන් පැලැස්ස ගමේ අපූරු සිදුවීම් රැසක් සතිපතා විකාශය කරන ගුවන් විදුලි නාට්‍යකි.නගරයේ වෙසෙන මල්කි ග්‍රාමීය පරිසරයේ ස්වභාවය සිතින් මවා ගැනීමට එමඟින් උත්සාහ ගත්තාය.මෙය,

(1) පරිකල්පනය යි. (2) දොරටුපාල සංකල්පය යි.

(3) අභිසාරිතාවය යි. (4) අග්‍රස්ථානය යි.

(19) ඉහත සංසිද්ධියට අනුව මල්කිගේ අත්දැකීමට අදාළ සන්නිවේදන වර්ග වනුයේ,

(1) වාචික සන්නිවේදනය , දෘශ්‍ය සන්නිවේදන

(2) ජන සන්නිවේදනය , අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

(3) වාචික සන්නිවේදනය , ජන සන්නිවේදනය

(4) ශ්‍රව්‍ය සන්නිවේදනය , අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

(20) සන්නිවේදන ක්‍රියාවලියේදී ග්‍රාහකයා යනු,

(1) සංදේශය සකස් කරන්නා ය.
(2) සන්නිවේදන ක්‍රියාවේ ආරම්භකයා ය.
(3) බාධා ඇති කරන්නා ය.
(4) සංදේශය ප්‍රතිග්‍රහණය කරගන්නා ය.

(21) ස්මාර්ට් ජංගම දුරකථනය හා සම්බන්ධ නව මාධ්‍ය විධික්‍රමයක් වන්නේ,

(1) ඡායාරූප සංස්කරණය
(2) වීඩියෝ දර්ශන ලබා ගැනීම.
(3) විද්‍යුත් තැපැල භාවිතය
(4) කෙටියෙන් පණිවිඩය පැවසීමටය.

(22) මහජනයාට වැඩි වැදගත්කමක් සහිත බලපෑමක් ඇති කරන තොරතුරු පුවත්පතේ මුල් පිටුවේ පළවේ.ඒවා,

(1) දෘඪ පුවත් ය.
(2) මෘදු පුවත් ය.
(3) විශේෂාංග පුවත් ය.
(4) ගවේෂණාත්මක පුවත් ය.

(23) සන්නිවේදනය ද්වි මාර්ගික ක්‍රියාවලියක් වීමෙන්,

(1) සාර සන්නිවේදනයක් සිදු වේ.
(2) සන්නිවේදනය අවහිර වේ.
(3) ප්‍රතිපෝෂණයක් නොලැබේ.
(4) බලපෑමක් ඇති නොවේ.

(24) කාලීන තත්වයන් මත විවධ හේතු පෙරදැරි කරගෙන සමාජ මාධ්‍ය තහනම් කිරීම පසුගිය කාලයේ නිරන්තරයෙන් ම සිදුවිය.මෙහි අවසාන ඵලය වන්නේ,

(1) ග්‍රාහකයා එම මාධ්‍යයෙන් ඉවත්වීමයි.

(2) ග්‍රාහකයාට ජන මාධ්‍යයෙන් ලැබෙන තොරතුරු පිළිබඳ ව විශ්වාසයක් නොමැති විමයි.

(3) රජයේ නිසි බලධාරියාගේ අභිප්‍රායන් ඉටුවිමයි.

(4) ග්‍රාහකයාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය ඇහිරීමයි.

(25) අවස්ථාවට,අරමුණට,ග්‍රාහක ස්වභාවයට අනුකූල භාෂාව උචිත ලෙස හැසිරවීම සාර්ථක සන්නිවේදනයකට හේතු වේ.මීට අදාළ වාචික සන්නිවේදන කුසලතාව වන්නේ,

(1) උච්චාරණය
(2) අර්ථ ගැන්වීම
(3) සාක්ෂරතාව
(4) යෝග්‍යතාව

(26) රටක පුරවැසිභාවය හිමිවන්නේ,

(1) ජීවත්වන අවුරුදු 18 ට වැඩි සියලු වැසියන්ටයි.

(2) පාරම්පරිකව හා නිත්‍යානුකූලව පදිංචි වී සිටින්නන්ට යි.

(3) රජය වෙනුවෙන් වැඩ කරන ශ්‍රමිකයන්ට යි.

(4) ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ය.

(27) ඕනෑම පුද්ගලයකු තමන් තමන් සමඟ සන්නිවේදනයේ යෙදීමේදී මාධ්‍ය ලෙස භාවිත කරන්නේ,

(1) ජංගම දුරකථනය (2) පංච ඉන්ද්‍රියන්

(3) විද්‍යුත් මාධ්‍ය (4) මනස

(28) විවිධ ආගමික ප්‍රතිරූපකයන් නිරන්තරයෙන් ම සමාජයේ බිහි වේ.මෙවැනි අවස්ථාවක ජන මාධ්‍යයන්හි වගකීම වන්නේ,

(1) ප්‍රතිරූපකයන් නොසලකා හැර සුපුරුදු පරිදි කටයුතු කිරීමයි.

(2) ප්‍රතිරූපකයන් හා විද්වතුන් අතර සංවාද සඳහා මණ්ඩපයක් සැකසීමයි.

(3) ජනමත විචාරණයන් සිදු කර ප්‍රතිඵල ඉදිරිපත් කිරීමයි.

(4) මෙවැනි මතවාද ප්‍රතික්ෂේප කිරීමට ජනතාව පෙළ ගැස්වීමය.

(29) " ඔබට සන්නිවේදනය නොකර සිටිය නොහැක." මෙම ප්‍රකාශයට අනුව මානවයා බහුලවම භාවිතා කරන්නේ,

(1) වාචික ස්වරූපය (2) දෘශ්‍ය ස්වරූපය

(3) අවාචික ස්වරූපය (4) ශ්‍රව්‍ය ස්වරූපය

(30) අතීත මානවයා භාවිතා කළ සම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රමයක් නොවන්නේ,

(1) පෝස්ටර් (2) ජනකතා (3) පුරාණෝක්ති (4) ජන ක්‍රීඩා

(31) " වචන දහස් ගණනකින්වත් කිව නොහැකි දෙයක් එක් රූපයකින් සිත්තම් කොට පලකළ හැක."යනුවෙන් චීන දාර්ශනික ලෝට්ස්ගේ මෙම ප්‍රකාශය අදාළ වන්නේ,

(1) ජන මාධ්‍යයන්ට (2) සිනමාවට

(3) ඡායාරූපයට (4) ටෙලි නාට්‍යයට

(32) යම්කිසි කලා නිර්මාණයක් සාධාරණ භාවිතයට ගත නොහැකි අවස්ථාවක් වන්නේ,

(1) අදහස් දැක්වීමකදී　　(2) අධ්‍යයනික කටයුත්තකදී

(3) ඉගෙනුම් කාර්යයේදී　　(4) ආර්ථික කටයුත්තකදී

(33) මාධ්‍ය ආයතනයක දොරටුපාලන ක්‍රියාවලියට අදාළ නොවන්නේ,

(1) ග්‍රාහකයා　　(2) ආයතන හිමිකරු

(3) අධ්‍යක්ෂ මණ්ඩලය　　(4) සංස්කාරක


(34) මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳව වැදගත් ප්‍රකාශය වන්නේ,

(1) ජන සන්නිවේදන ක්‍රියාවලිය අවබෝධ කර ගැනීමයි.

(2) මාධ්‍ය ආචාරධර්ම ආයතනයන් අනුව වෙනස් වන බව අවබෝධ කර ගැනීමයි.

(3) මාධ්‍ය බලපෑම් අවබෝධ කරගෙන ඉන් මිදීමයි.

(4) ලිඛිත,ශ්‍රව්‍ය,දෘශ්‍ය සියලු මාධ්‍ය ඔස්සේ ලැබෙන සංදේශ නිවැරදි ලෙස ග්‍රහණය හා පරිහරණය යි.


A


B


C


D


E

35 සිට 39 දක්වා පිළිතුරු ඉහත රූප සටහන් ඇසුරින් සොයන්න.

(35) පාසලේ පැවති විවිධ උත්සව අවස්ථා වලදී විශාල පිරිසකට පෙර සූදානමකින් යුතුව වගු,චාට්,වීඩියෝ දර්ශන ආදිය පෙන්විය හැක්කේ,

(1) B　　(2) C　　(3) D　　(4) E

(36) සයිබර් ප්‍රහාරයන්ට නිරන්තරයෙන් ලක්වන ලෝක ව්‍යාප්ත ජාලයට අදාළ මෙවලම වන්නේ,

(1) B　　(2) C　　(3) D　　(4) E

(37) විදුලි බලය නොමැති අවස්ථාවක අවශ්‍ය දෑ ලියමින් විශේෂ සටහන් වලට අවධානය යොමු කරමින් ඉගෙනුම් කාර්ය සඳහා භාවිතා කළ හැකි ඉහත මෙවලමක් වන්නේ,

(1) පත්‍රිකා ලෑල්ල　　(2) පිටු පෙරළනය

(3) ෆැක්ස් යන්ත්‍රය　　(4) අන්තර් ක්‍රියාකාරී පුවරුව

(38) ඉහත රූපවල සඳහන් ව නොමැති තමා ළඟ ඇති රූපයක් ඉක්මනින් පෙන්විය හැකි ප්‍රක්ෂේපණය උපකරණය,

(1) ආවෘත පරිපථ රූපවාහිනී පද්ධති　　(2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය　　(4) ප්‍රතිශිර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(39) පාසලේ දරුවන්ගේ රූපවාහිනී නැරඹීම පිළිබඳ ව සමීක්ෂණයක දී පහත කරුණු ඇතුළත් කළ යුතු බව සිසුන් කිහිපදෙනෙක් යෝජනා කරන ලදී.

A - ඉවහල් වූ සමීක්ෂණ විධි ක්‍රමය

B - තොරතුරු විශ්ලේෂණය කළ අයුරු

C - සමීක්ෂණය සිදු කිරීම පිළිබඳ ව ලැබුණු ප්‍රතිචාර

D - සමීක්ෂණයෙන් එළඹුණු නිගමන

මේ අතරින් වාර්තාවට ඇතුළත් කළ යුත්තේ,

(1) A , B හා C පමණි.　　(2) A , B හා D පමණි.

(3) A , C හා D පමණි.　　(4) B , C හා D පමණි.

(40) සන්නිවේදනයේ නිර්මාණාත්මක බව ඇති කිරීමට බහුලව යොදා ගන්නා දෘශ්‍ය ප්‍රකාශන විධික්‍රමයක් වන්නේ,

(1) හඬ　　(2) ප්‍රස්තාව පිරුළු　　(3) අභිනය　　(4) සංගීතය

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය

I පත්‍රය - 11 ශ්‍රේණිය

<u>පිළිතුරු පත්‍රය</u>

| | | | |
|---|---|---|---|
| (1) – 1 | (11) - 2 | (21) - 3 | (31) - 3 |
| (2) - 3 | (12) – 1 | (22) – 1 | (32) - 4 |
| (3) – 2 | (13) – 1 | (23) – 1 | (33) - 1 |
| (4) – 3 | (14) – 2 | (24) – 4 | (34) - 4 |
| (5) – 2 | (15) – 4 | (25) – 4 | (35) - 4 |
| (6) – 4 | (16) – 3 | (26) – 2 | (36) - 1 |
| (7) – 1 | (17) - 3 | (27) – 2 | (37) - 2 |
| (8) – 3 | (18) - 1 | (28) – 2 | (38) - 3 |
| (9) – 1 | (19) - 2 | (29) – 3 | (39) - 2 |
| (10) - 4 | (20) - 4 | (30) – 1 | (40) - 3 |

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර ඇගයීම
மூன்றாந் தவணை
Third Term Evaluation
**2019**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

(01) ලෝක රූපවාහිනී දිනය වෙනුවෙන් " රූපවාහිනීය හා ළමයා" යන මාතෘකාව යටතේ උදෑසන රැස්වීමේදී කථාවක් පැවැත්වීමට ජනිතට පවරා තිබුණි.

( i ) ලෝක රූපවාහිනී දිනය කවදාද?

( ii ) ළමයින් ඉලක්ක කරගත් රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද දෙකක් ලියන්න.

(iii) රැස්වීම ඇමතීමේදී ජනිත භාවිතා කරන්නට ඇතැයි ඔබ සිතන අවාචික සන්නිවේදන ක්‍රම දෙකක් ලියන්න.

(iv) ජනිත සිය කථාව සකස් කිරීමට තොරතුරු ලබා ගත් තොරතුරු මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

( v ) තොරතුරු ඉදිරිපත් කිරීමේදී වඩා සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

(vi) නිර්මාණාත්මකව හා ආකර්ශනීය ලෙස කථා කිරීමට භාවිතා කළ හැකි භාෂාත්මක ප්‍රකාශන විධි දෙකක් ලියන්න.

(vii) කථා,දේශන,ඇමතීම් බුද්ධිමය දේපළ ලෙස සලකනු ලබයි.බුද්ධිමය දේපළ සම්බන්ධ අයිතිවාසිකම් වර්ග දෙක නම් කරන්න.

(viii) රූපවාහිනී මාධ්‍යයේ නව තාක්ෂණික ප්‍රවණතා දෙකක් ලියන්න.

(ix) කථාව පැවැත්වීමේදී ජනිත යොදා ගන්නා ලද මහජන ඇමතුම් පද්ධතියට අයත් උපකරණ දෙකක් නම් කරන්න.

( x ) ජනිතගේ කථාවට සවන් දෙන ග්‍රාහකයන්ට තිබිය යුතු ආචාරශීලි ගුණාංග දෙකක් ලියන්න.

(02) මිනිසුන් තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමට විවිධ මාධ්‍ය යොදා ගනී.


( i ) මාධ්‍ය සංදේශ පරිහරණය කරන ආකාරය අනුව ග්‍රාහකයා බෙදෙන කාණ්ඩ දෙක නම් කරන්න.

( ii ) මිනිසාට තොරතුරු වැදගත්වන ආකාර දෙකක් ලියන්න.

(iii) ජන මාධ්‍ය මඟින් සමාජයට එල්ලවන බලපෑම් තුනක් විස්තර කරන්න.

(iv) විචාරශීලි ග්‍රාහක නිපුණතා හතරක් විස්තර කරන්න.

(03)




( i ) ඉහත දක්වා ඇති සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කලේ කවුද?

( ii ) ඉහත ආකෘතියේ E යනු කුමක් දැයි කෙටියෙන් විස්තර කරන්න.

(iii) සමූහ සන්නිවේදනයේ ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(iv) සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් විස්තර කරන්න.

(04) පොත් හා පුවත්පත් ජනප්‍රිය මුද්‍රිත මාධ්‍ය ස්වරූපයන්ය.

( i ) පොතක් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වන සිද්ධාන්තය කුමක් ද?

( ii ) මුද්‍රිත මාධ්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) ප්‍රවෘත්ති වාර්තාකරණයේදී යටිකුරු පිරමිඩ ආකෘතිය යොදා ගැනීමේ වාසි තුනක් විස්තර කරන්න.

(iv) නිශ්චල ජායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි හතරක් විස්තර කරන්න.

(05) විධිමත් අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් ලෙස පාසල හැඳින්වේ.

( i ) විධිමත් සන්නිවේදනයේ රෝද ආකෘතිය රූප සටහනකින් දක්වන්න.

( ii ) පුද්ගලාන්තර සන්නිවේදනයේදී යොදා ගත හැකි නව මාධ්‍ය විධික්‍රම දෙකක් ලියන්න.

(iii) කාර්යක්ෂම සන්නිවේදන ක්‍රියාවලියක් සඳහා කාර්යාලයක භාවිත වන මාධ්‍ය උපකරණ තුනක් නම් කර ඒවාහි වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

(iv) සන්නිවේදන බාධක වර්ග දෙක උදාහරණ සහිතව විස්තර කරන්න.

(06) සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ ලොව සිදුවන වැදගත් සිදුවීම් ක්ෂණික ව දැනගැනීමට හැකි වී ඇත.

( i ) තාක්ෂණික දියුණුව හේතුවෙන් විවිධ මාධ්‍ය 'එකට හමුවීම' හඳුන්වන නම කුමක් ද?

( ii ) නව තාක්ෂණය යොදා ගන්නා ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා දෙකක් ලියන්න.

(iii) විද්‍යුත් පුවත්පතක පොදු ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(iv) තාක්ෂණය අනිවාර්යයෙන් භාවිත වන ජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න.

(07) "සුහුරු පන්තිකාමරය" සංකල්පය වර්තමානයේ පාසල්වල ජනප්‍රිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයකි.

( i ) සුහුරු පන්තිකාමර සංකල්පයේදී භාවිතා කරන ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණය කුමක් ද?

( ii ) අන්තර්ජාලය මඟින් ලබාගත හැකි ඉගෙනුම් අවකාශ හතරක් ලියන්න.

(iii) ගුවන් විදුලි මාධ්‍ය භාවිතයේ ප්‍රබලතා තුනක් ලියන්න.

(iv) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ (DTP ක්‍රියාවලියේ) වාසි හතරක් විස්තර කරන්න.

පිළිතුරු

(01) ( i ) නොවැම්බර් 21

( ii ) ප්‍රවෘත්ති,ටෙලි නාට්‍ය,සංගීත වැඩසටහන්,සඟරාමය වැඩසටහන්,යථාකාරී රූපවාහිනී වැඩසටහන්

(iii) මුහුණේ ඉරියව්,ඇස් සම්බන්ධතාව,පාර භාෂාව,අංග චලන,සංඥා සංකේත

(iv) පුද්ගල මූලාශ්‍ර,ආයතනික මූලාශ්‍ර,ලිඛිත මූලාශ්‍ර,මාධ්‍ය මූලාශ්‍ර

( v ) නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව,විශ්වාසනීයත්වය

(vi) උපමා උපමේයන්,ප්‍රස්ථාව පිරුළු,ව්‍යංගාර්ථ,කවි,ගීත,ආප්තෝපදේශ,රූපක,උපුටා ගැනීම්

(vii) ආර්ථික අයිතිවාසිකම් හා සදාචාර අයිතිවාසිකම්

(viii) අංකිත රූපවාහිනී තාක්ෂණය,චන්ද්‍රිකා තාක්ෂණික රූපවාහිනී විකාශනය,ත්‍රිමාණ රූපවාහිනී තාක්ෂණය

(ix) ශබ්ද විකාශන උපකරණ ,මයික්‍රෆෝනය

( x ) සාවධානව අසා සිටීම,බාධා නොකිරීම,අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීම,අදාළ කාලය තුළ රැඳී සිටීම.

(02) ( i ) සක්‍රිය ග්‍රාහකයා,නිෂ්ක්‍රිය ග්‍රාහකයා

( ii ) පුද්ගල අවශ්‍යතා සපුරාලීමට,තීරණ ගැනීමේ ක්‍රියාවලියට,පුද්ගල සබඳතා ගොඩනැගීමට,අධ්‍යාපන කටයුතුවලට,ගැටලු නිරාකරණයට,නිර්මාණශීලි චින්තනයට

(iii) දෛනික ජීවිතය වෙනස් කිරීම,පරිභෝජන රටාව වෙනස් කිරීම,රස වින්දනය වෙනස් කිරීම,චිත්ත වේග වැඩි දියුණු කිරීම,විවිධ අපචාරි චර්යා කරා යොමු කිරීම,අයෝග්‍ය පුරුදු ඇතිකිරීම,ජීවිත ගැටලුවලට අයෝග්‍ය තීරණ ගැනීමට හුරු කිරීම,අනුකරණයට යොමු කිරීම.

(යහපත් අයහපත් බලපෑම් සැලකිල්ලට ගත හැක.)

(iv) * ජන මාධ්‍ය සංදේශ නිසි ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව,
* මාධ්‍ය මඟින් සඟවන දේ අවබෝධ කර ගැනීමේ හැකියාව.
* ජන මාධ්‍ය අරමුණු හඳුනා ගැනීමේ හැකියාව.
* ජන මාධ්‍ය උත්සහ දරන්නේ තමා කෙබඳු පුද්ගලයෙකු බවට පත් කිරීමට ද යන්න අවබෝධ කර ගැනීමේ හැකියාව.
* ග්‍රාහකයා පොළඹවා ගැනීමේ උපාය මාර්ග තේරුම් ගැනීම.
* තමාට අවශ්‍ය දේ පමණක් තෝරාගෙන පරිහරණය කිරීමට ඇති හැකියාව.
* මාධ්‍ය වෙත ප්‍රතිචාර දැක්වීම හා අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීම.

(03) ( i ) හැරල්ඩ් ඩී ලැස්වෙල්

( ii ) බලපෑම - සන්නිවේදකයා තම පණිවිඩයට ග්‍රාහකයාගෙන් අපේක්ෂා කරන වෙනස යි.ආකල්පමය හෝ චර්යාත්මක වෙනසක් විය හැක.

(iii) * සමූහය කුඩා හෝ විශාල වීම.
* පොදු අරමුණ ඇතිව සමූහය එකට එකතු වීම.

* සන්නිවේදකයා ඉදිරියේ සිටින තැනැත්තන් සමග කෙරෙන සන්නිවේදනයකි.
* ඒක පාර්ශ්විකයි හෝ ද්විපාර්ශ්වික විය හැක.
* සන්නිවේදකයා හා ග්‍රාහක පිරිස අතර පොදු සම්බන්ධතාවක් ඇත.
* නායකත්වයක් ඇත.

(iv) තොරතුරු සම්පාදනය,අධ්‍යාපනය,පෙළඹවීම,විනෝදාස්වාදය


(04) ( i ) * මතවාද පළ කිරීම,තොරතුරු පළ කිරීම,නිර්මාණාත්මක ප්‍රබන්ධ

( ii ) කතෘගේ ජීවිත කාලය තුල ද ඉන් පසු වසර 75 ක කාල සීමාවක් දක්වා

(iii) * මුල් පාඨය කියවීමෙන් ප්‍රවෘත්තියේ සාරාංශයක් දැන ගත හැකිවීම.
* ප්‍රවෘත්ති ඉඩකඩ සීමා වන අවස්ථාවක ප්‍රවෘත්තියේ හරයට හානි නොවන ලෙස අවසාන කොටස් ඉවත් කිරීමට හැකි විම.
* කාලය ඉතිරි කර ගනිමින් ග්‍රාහකයාට වැදගත් කරුණු පමණක් ග්‍රහණය කර ගත හැකි විම.

(iv) අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීම,ග්‍රාහක විශ්වාසය දිනාගැනීම,ග්‍රාහක ආකර්ශනය දිනා ගැනීම,මුද්‍රණ තාක්ෂණය සමඟ පහසුවෙන් අනුගත විම,පහසුවෙන් තේරුම් ගැනීමට හැකියාව.

(05) ( i )




( ii ) විද්‍යුත් තැපැල ,සමාජ ජාල . ස්කයිප් .කෙටි පණිවිඩ , Apps - වයිබර් , වට්ස් ඇප් , ඉන්ස්ටග්‍රෑම්,චැට් කිරීම

(iii) නිල මුද්‍රාව , දින මුද්‍රාව , ගණක යන්ත්‍රය , පරිගණකය , තැපැල් මුද්‍රා යන්ත්‍රය

(iv) මාධ්‍ය බාධක , අර්ථ බාධක

(06)( i ) මාධ්‍ය අභිසාරිතාව

( ii ) * අඩු ආලෝක තත්ත්ව වලදීද ඡායාරූප ගත හැකි විම.
* අනවශ්‍ය ඡායාරූප මකා දැමීමට හැකි විම.
* ඡායාරූප ඒම අවස්ථාවේදීම නැරඹීමට හැකි විම.
* කාර්යක්ෂමතාව.
* පරිගණකය හා සම්බන්ධ කළ හැකි විම.
* සංස්කරණය.
* අන්තර්ජාලයට යොමු කිරීම පහසු විම.
* ගබඩා කර තබා ගැනීමේ පහසුව.
* වෙනත් මාධ්‍යකට පහසුවෙන් යොමු කළ හැකි විම.
* අවශ්‍ය තරම් ඡායාරූප ලබා ගැනීමට හැකි විම.
* පහසුවෙන් මෙහෙය වීමට හැකි විම.

(iii) ක්ෂණිකව පුවත් දැන ගැනීම, ගබඩා කර තැබීමේ පහසුව,නැවත නැවත කියවිය හැකි වීම,තොරතුරු විෂයයන් අනුව වර්ග කිරීම,යාවත්කාලින කිරීමේ පහසුව, ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම.

(iv) විධිමත් සංවිධානය වූ ආයතනයකි,වෘත්තීය මාධ්‍යවේදීන් සිටීම,ග්‍රාහකයා ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයකි,සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ/දුරස්ථයි,සංදේශය පොදු ය,දියුණු තාක්ෂණික උපකරණ භාවිත වේ,ප්‍රතිපෝෂණය ප්‍රමාදී වේ,බහුවිධ දොරටුපාලකයන් සිටීම.

(07) ( i ) අන්තර් ක්‍රියාකාරී පුවරුව

( ii ) * දැනුම හා තොරතුරු හුවමාරු කර ගැනීම.(මිතුරන්/ජාතික හා ලෝක මට්ටමින්)
* බහු මාධ්‍ය පරිහරණය මඟින් ඉන්ද්‍රිය සංවේදනයන් දියුණු වීම.
* ලෝකය පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
* විවිධ ජන කණ්ඩායම් හා සංස්කෘතීන් පිළිබඳ ඉගෙනීම.
* විවිධ විෂයයන්ට අදාළ තොරතුරු රැස් කළ හැකි වීම.
* අධ්‍යාපනය ප්‍රියජනක වීම.
* වෙනත් භාෂා ඉගෙනීම පහසු වීම.

(iii) අතිශය ක්ෂණික මාධ්‍යයකි,එසැණින් අසන්නන්ට යොමු වේ,ජංගමශීලි මාධ්‍යයක් වීම,භූගෝලීය බාධක විරලය,අඩු වියදම් මාධ්‍යයකි,පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයකි,,පරිකල්පණීය මාධ්‍යයක් වීම.

(iv) අඩු පිරිවැය,ආකර්ශනීය නිමාව,ඉක්මන් බව,පහසුව,කාර්යක්ෂමතාව